නිපුණතාව 07 : රසඥතා වර්ධනය සඳහා බහුවිධ සංස්කෘතිකාංගවල වටිනාකම් විචාරයට ලක්කරයි.
නිපුණතා මට්ටම7.2: බටහිර බැලේ පිළිබඳ කරුණු ඉදිරිපත් කරයි.
ක්‍රියාකාරකම් 7.2 : බටහිර බැලේ පිළිබඳ තොරතුරු විමසමු.

- **<u>නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.</u>**

01. බටහිර බැලේ (Ballet) රංග කලාවේ නිජබිම වශයෙන් හඳුන්වනුයේ,
 (i). ප්‍රංශය (ii). ඕස්ට්‍රේලියාව (iii). ඉතාලිය (iv). රුසියාව

02. ප්‍රථම බැලේ නාට්‍යය වනුයේ,
 (i). නිදි කුමරිය (ii). නට් ක්රැකර් (iii). ජේසන් සහ රන්ලෝම බැටලුවෝ (iv). හංසවිල

03. (Sunking) යන අන්වර්ථ නාමයක් පට බැඳුණු රජු වනුයේ,
 (i). ජීන් ජෝර්ජස් නෝර්වේ (ii). 14 වන ලුවී (iii). කැතරින් කුමරිය (iv). මාරියස් පෙටීපා

04. 14 වන ලුවී රජුගේ ප්‍රථම බැලේ නර්තන පුහුණු පාසල ලෙස හඳුන්වන්නේ,
 (i). බෝල්ෂෝයි පාසල (ii). පැරිස් ඔපෙරා පාසල
 (iii). ද ඇකඩමි රෝයල් ඩාන්ස් බැලේ පාසල (iv). ෆ්රැන්සිස්කෝ පාසල

05. ඉම්පීරියල් රඟහලේ ප්‍රධානියා විය.
 (i). මාරියස් පෙටීපා (ii). වෙයිකොස්කි
 (iii). ජීන් ජෝර්ජ් නෝර්වේ (iv). කාර්ලෝ බ්ලැසිස්

- **<u>හිස්තැනට සුදුසු පිළිතුරු ලියන්න.</u>**

06. කැතරින් ඩී මෙඩිසි බිසව විසින් ඉතාලි රාජ සභාව වෙත කැඳවා ගත් ප්‍රධාන සංගීතඥයා.......................................ය.

07. රුසියානු බැලේ කලාවේ මූලිකයා ........................................................................ නම් විය.

08. 'නට් ක්රැකර්' ලෝක ප්‍රකට බැලේ නිර්මාණයට ...................................................................... විසින් සංගීතය සැපයීය.

09. බ්‍රිතාන්‍යට බැලේ රංග කලාව අවතීර්ණ වූයේ ..................................................................... සියවසේ අග භාගයේදීය.

10. නව නර්තන කලාවක් (Modern dance) බිහි වූ රටවල් අතර ................................. සහ..............................ප්‍රධාන වේ.

- **<u>ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.</u>**

11. බැලේ යන වචනය අර්ථ දක්වන්න.

12. බටහිර බැලේ නාට්‍ය ඉතාලියෙන් ආරම්භ වී ඇමරිකාව කැනඩාව දක්වා ව්‍යාප්තිය පිළිබඳ තොරතුරු දක්වන්න.

13. මාරියස් පෙටීපාගේ ලෝක ප්‍රකට බැලේ නාට්‍ය 3 ක් නම් කරන්න.

14. ප්‍රංශයේ xiv වන ලුවී රජුගේ බැලේ නර්තන දායකත්වය අගයන්න.